# වයඹ පලාත් පාලන දෙපාර්තමේන්තුව

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයේ /50 වන සභා වාරයේ මහා සභා රැස්වීම් වාර්තාව

### 2022-04-08

**පැමිණීම**

1. ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතා
2. ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතා
3. ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා
4. ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා
5. ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා
6. ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා
7. ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය
8. ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා
9. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා
10. ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා
11. ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා
12. ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා
14. ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය
15. ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය
16. ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා
17. ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය
18. ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා
19. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතා
20. ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතා
21. ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා
22. ගරු මන්ත්‍රී ජී.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා
23. ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා
24. ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා
25. ගරු මන්ත්‍රී එල්. සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
26. ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා
27. ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා

28. ගරු මන්ත්‍රී ඩබ්.සුරේන් ඇන්ටන් ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා
29. ගරු මන්ත්‍රිනී පී.එම්.ලිහිණි අනුත්තරා ප්‍රභාෂි මෙනවිය
30. ගරු මන්ත්‍රිනී එම්.එම්.මේරි.වාලට් කුරේ මහත්මිය
31. ගරු මන්ත්‍රිනී ඩබ්.දුලක්ෂි වමෝදරී ප්‍රනාන්දු මහත්මිය
32. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝධාභය වික්‍රමසිංහ මහතා
33. ගරු මන්ත්‍රිනී ඒ.එම්.චමිලා දිල්රුක්ෂිකා මහත්මිය
34. ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා
35. ගරු මන්ත්‍රී එස්.එම්.සුදත් චන්දන මහතා
36. ගරු මන්ත්‍රී අයි.බී.සෑම් හරිෂ්නාත් සරත්චන්ද්‍ර මහතා
37. ගරු මන්ත්‍රී එස්.එම්.දර්ශන දිමුතු කුමාර සුභසිංහ මහතා

මෙදින පෙ.ව.10.00ට මහා සභා රැස්වීමේ කටයුතු ගරු සභාපති කේ.වී.සුසන්ත පෙරේරා මහතාගේ ප්‍රධානත්වයෙන් වෙන්නප්පුව ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ විය.

ආගම සිහිකිරීමෙන් අනතුරුව මහා සභා රැස්වීම සඳහා සහභාගී වී සිටින ගරු උපසභාපතිතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්/තුමියන් හා සහභාගී වී සිටින ලේකම්මහතා හා එම නිලධාරීන් ඇතුළු සියළු දෙනාම මහා සභා රැස්වීම සඳහා ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදී.

## 01. 2022-03-10 වන දින පැවති මහා සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම.

ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් අනතුරුව මෙම මහා සභා වාර්තාවේ පිටු අංක 14හි තීරණ අංක 18 නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදී. මෙය මින් පෙර ගරු සභාපතිතුමා විසින්ම මෙම මාර්ගයේ ජනතාව කැඳවා සාකච්ඡා කල බවත් විරෝධතාවය ප්‍රකාශ කර ඇති අත්සන් ලේඛණයක්ද තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම **ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතාට මෙය යෝජනා කිරීමට නොහැකි බවත් එම කොට්ඨාසය භාර මන්ත්‍රීවරයා වන්නේ** ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා මහතා බවත් ප්‍රකාශ කල අතර වැරදි පූර්වාදර්ශ සභාවට ලබා නොදෙන ලෙසත් සභාවට ගරු කරන බවත් පවසා සිටින ලදී. මෙම මාර්ගයට අහස්දියවල පාර ලෙස නමක් තිබෙන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
මෙය නිවැරදි කරන බවත්, මෙහි ගැටළුවක් මතු වී ඇති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කිංස්ලි පෙරේරා යනු ඉතාමත් හොඳ පුද්ගලයෙකු බවත්, ප්‍රදේශයට හුඟාක් වැඩ කල පුද්ගලයෙකු බවත් පක්ෂභේද වැඩක් නොමැති බවත් ගරු මන්ත්‍රී ඒ.රෙක්ෂි ප්‍රභාත් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.කොටස් කල ඉඩමේ ජනතාව මෙහිදී මේ සඳහා සම්බන්ධ කර නොගන්නා ලෙසත් ඔවුන් ළඟදී පැමිණි පිරිසක් බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

මෙය විශාල වාද විවාදයක් ගොස් සභාවට ගෙන්වා සාකච්ඡා කල කරුණක් බවත් මෙම කොටස වාර්තාවෙන් ඉවත් කරන බවත් තිබෙන ගැටළුව අවසන් වූ පසුව මේ සඳහා කටයුතු කරමුයැයිද දැනට තාවකාලිකව මෙය මෙතැනින් නතර කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

නිවැරදි ආකෘති පත්‍රය පුරවා සභාවට ඉදිරිපත් කලේ නම් එහිදී ප්‍රදේශයේ ජනතාවගේ එකඟතාවයද තිබෙන බවත් එය මහා සභවට ඉදිරිපත් කල යුතු බවත් ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව ලිපි ගොණුවක්ම තිබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කෙසේ නමුත් මේ සම්බන්ධව මන්ත්‍රීවරුන් නොදැන මෙය යෝජනා කර ඇති බවත් මෙය සංශෝධනය කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව පසුගිය සභා වාරයේදී තමන් නොසිටි බවත් මෙහිදී මේ පිළිබඳව එම සභා වාරයේදී සාකච්ඡා නොවූ බව පවසන බවත් ප්‍රකාශ කරන ලදී.

එය සාකච්ඡා කල බවත් එහිදී එකඟතාවයකට නොපැමිණි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් සම්මත වූ බවට සඳහන් කර ඇත්තේ මන්දැයි ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා විමසා සිටින ලදී.

යම් කරුණු කාරණා එකඟතාවයකට පැමිණි බවට වාර්තාවේ සඳහන් කරන බවත්, එබැවින් සංශෝධනය කිරීමට සභාවේ අවස්ථාවක් ලබාදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| තීරණ අංක 01 |
|---|
| **2022-03-10 වන දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.පුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.** |

## 02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන

## 01.නිවාඩු අනුමත කිරීම

a) මහා සභාව සඳහා නොපැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

රටේ පවතින තත්ත්වය හමුවේ වැටුපක් නොලබා ටික කලක් සභාවේ කටයුතු කිරීමට ගරු මන්ත්‍රීවරුන් වශයෙන් නොහැකිදැයි ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා විමසා සිටින ලදී.මෙය ආදර්ශයක් ලෙස ලබා දෙමුයැයි ද ප්‍රකාශ කරන ලදී.

සියළුම මන්ත්‍රීවරුන් කැමති නම් ගැටළුවක් නොවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම ආහාර නොමැතිව ජනතාව සිටින බවත්, සංග්‍රහ මේසයද සූදානම් නොකරන ලෙසත් තේ පමණක් පානය කර නැතහොත් ජලය පානය කර මෙම පැය දෙක තුන සාකච්ඡා කර නිවසට යමුයැයිද ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.තමන් මෙහිදී යෝජනාවක් ගෙන ආ බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
එසේ නම් එම මුදලින් නැති බැරි ජනතාවට ආහාර ලබා දෙමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කල අතර මේ පිළිබඳව පසුව සාකච්ඡා කරමුයැයිද ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 02

මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු අයදුම්කර ඇති පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමා ඉදිරිපත් කල යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

- ගරු මන්ත්‍රී ඩබ්.ස්ටැන්ලි තිසේරා මහතා
- ගරු මන්ත්‍රී ඩබ්. ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා
- ගරු මන්ත්‍රිනී එච්.එම්.එස්.බී. කරුණාරත්න මෙනවිය
- ගරු මන්ත්‍රිනී ආර්.පී.නදීකා රණවීර මහත්මිය
- ගරු මන්ත්‍රී වී.ඒ.වර්ණ රංග ගුණසේකර මහතා
- ගරු මන්ත්‍රී වී.කේ.එම්.අසන්ත කුලසේකර මහතා

b) කාරක සභා සඳහා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම.

තීරණ අංක 03

2022 පෙබරවාරි මස සහ මාර්තු මස පැවති පහත සඳහන් කාරක සභා සඳහා **සහභාගී නොවූ පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ හා ගරු මන්ත්‍රීවරියන්ගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.**

**2022 මාර්තු මස 21** වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| **1.** | ගරු මන්ත්‍රී එල්.කේ.ජගත් ප්‍රියංකර මහතා |
| **2.** | ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා |
| **3.** | ගරු මන්ත්රී කේ. නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්රනාන්දු මහතා |
| **4.** | ගරු මන්ත්‍රිනි එච්.එම්. සුදර්ශි භාග්‍යා කරුණාරත්න මෙනවිය |

**2022 පෙබරවාරි මස 18** වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

**2022 මාර්තු මස 04 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

**2022 මාර්තු මස 18 වන දින පැවති මාර්ග, ඉඩම් , ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 2. | ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා |
| 3. | ගරු මන්ත්‍රීනී නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 4. | ගරු මන්ත්‍රී එල්.දිනේෂ් චන්දන පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්.ශිරෝන් ගාමිණී අසෝක ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එල්.සුසන්ත ශ්‍රීනාත් ප්‍රනාන්දු මහතා |

**2022 මාර්තු මස 24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රීනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී කේ.ඒල්.සී.කුමාර කරුණානායක මහතා |
| 3. | ගරු මන්ත්‍රී ඩී.එල්. අමල් සුරංග මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.එන්.සුදත් ජානක පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ඩබ්. ස්ටැන්ලි තිසේරා මහතා |
| 6. | ගරු මන්ත්‍රී වි.කේ.එම්. අසන්ත කුලසේකර මහතා |
| 7. | ගරු මන්ත්‍රී ඩී.නිමල්අරුණ ශාන්ති විජේතුංග මහතා |

**2022 මාර්තු මස 24 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභාව**

| අ/අ | නම |
|---|---|
| 1. | ගරු මන්ත්‍රී එල්.කේ .ජගත් ප්‍රියංකර මහතා |
| 2. | ගරු මන්ත්‍රීනී ජී.ලීනා ප්‍රියංගිකා පෙරේරා මහත්මිය |
| 3. | ගරු මන්ත්‍රී කේ.එල්.චමින්ද කුමාර කරුණානායක මහතා |
| 4. | ගරු මන්ත්‍රී කේ.එන්.එස්.ජේ.පෙරේරා මහතා |
| 5. | ගරු මන්ත්‍රී ජී.කේ.අශේන් විමුක්ති ප්‍රනාන්දු මහතා |
| 6. | ගරු මන්ත්‍රී එම්. ප්‍රියාල් බ්‍රයන්ත පෙරේරා මහතා |
| 7. | ගරු මන්ත්‍රිනි ආර්.පී. නදීකා රණවිර මහත්මිය |
| 8. | ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනි කුමාර් මහතා |

02. 2021 වර්ෂයට අදාල මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් මේ වන තෙක් නොලැබීම නිසා ගෙවීම් කටයුතු ප්‍රමාද වීම් සිදු වන බවද,මෙම ආදායම් ලබා ගැනීම සඳහා පලාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇති බවද ප්‍රකාශ කරමින් අද වන විට වේතන, දීමනා සහ අනෙකුත් සංවර්ධන

ක්‍රියාදාමයට ගෙවීමට තිබෙන බැවින් රු.මිලියන 20ක් ස්ථාවර තැන්පතු මුදලින් ගැනීමට අනුමැතිය ලබාදෙන ලෙසට ගරු සභාපතිතුමා යෝජනා කරන ලදී. එම මුදල ප්‍රධාන ලේකම් වෙතින් ලැබුණු පසුව නැවත තැන්පත් කරන බවද ප්‍රකාශ කරන ලදී.

ස්ථිර සේවක පඩිය අද වන විට භාණ්ඩාගාරය මඟින් සියළුම ආයතන වලට යවා ඇති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මන්ත්‍රීවරුන්ගේ දීමනාවද මාස දෙකකින් ප්‍රතිපූර්ණය වී නොමැති බවත් මේ සඳහා අනුමැතියක් ලබා දෙන ලෙසත් ඊළඟ සතියේ මෙම මුදල ලැබුණු පසුව අදාල මුදල නැවත තැන්පත් කරන බවද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

උත්සව අත්තිකාරම් සහ මාසික වැටුප අප්‍රියෙල් මස 10 වන දිනට පෙර ගෙවීම සාම්ප්‍රදාය බවත්, අප්‍රියෙල් මස 10 වන දින ඉරිදා දිනයක් බැවින් අද දින මෙය ගෙවිය යුතුම බවත් එබැවින් එය ගෙවීම සඳහා මෙම මුදල් ලබා ගැනීමට එකඟතාවය පල කරන බවත් නමුත් අදාල මුදල ලැබුණ පසුව නැවත මෙම මුදල ස්ථාවර තැන්පතුගත කරන ලෙසටද **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා** ඉල්ලා සිටින ලදී.

| |
|---|
| තීරණ අංක 04<br><br>සභාවේ අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යාම සඳහා කල් පිරී ඇති හෝ කල් පිරීමට ආසන්න ස්ථාවර තැන්පතුවකින් රු.මිලියන 20ක මුදලක් ආපසු ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා යෝජනා කල අතර උසාවි දඩ හා මුද්දර ගාස්තු ලද වහාම එම මුදල් නැවත ස්ථාවර තැන්පතු සඳහා ආයෝජනය කිරීමට යටත්ව එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබාදෙන ලදී.** |

03. සිරිලක කිතුණු සාහිත්‍ය වංශ කතාවේ ආරම්භයේ නිර්මාතෘවරයා වන අතිපූජ්‍ය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමන් නිර්මාණය කරන ලද "පසම්" හා "ලතෝනි" කාව්‍ය ස්වර ප්‍රස්ථාර සහිතව ග්‍රන්ථාරූඪ ගත කිරීම සහ රූප සංගීත සහිතව විශ්වය පවතින තෙක් පවතිනු පිණිස අන්තර්ජාලයට එක් කර දේශයේ කිතුනු ගීත කලාවට ඉටුකළ මෙහෙවර අගයනු පිණිස සංගීතවේදී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මැතිතුමන් වෙත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ප්‍රණාමය පුද කරන බව ගරු සභාපතිතුමා ගෞවර පූර්වකව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙය අප සභාවට ආඩම්බරයක් බව ප්‍රකාශ කරන ලදී. ඉංජිනේරු ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමා කුඩා අවධියේ සිටම ආගමට ඉතාමත් ලැදි පුද්ගලයෙකු බවත් එතුමාට සංගීතය පිළිබඳව සහජ හැකියාවක්ද තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.එමෙන්ම පාස්කු සමයේදී ජේසුගේ උත්තානය පිළිබඳව සිහිපත් කිරීමේදී පැරැන්නන්ගේ ලතෝනි සහ පසන් ගායනා කිරීම තිබූ බවත් ඒවා නැති වී යන අවධියක අප සභාවේ මන්ත්‍රීවරයෙකු මෙලෙස කටයුතු කිරීම පිළිබඳව ආඩම්බර විය යුතු බවත් පවසමින් නැවතත් අත්පොලොසන් නාදයකින් එතුමාට ගෞරවය පුද කරන ලදී.කොට්ඨාසයේ වෙන්නප්පුව සහා බල ප්‍රදේශයේ පළමු පුරවැසියා වන ගරු සභාපතිතුමාද , තමන්ද කොළින්ජාඩිය කොට්ඨාසයේ බවත්, එමෙන්ම ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාද කොළින්ජාඩිය කොට්ඨාසයේ බවද පවසමින් එයද ආඩම්බරයක් බව පවසමින් එතුමාට නිරෝගී සුවය සහ තැබූ අඩි තාලම ඉදිරියටම යාමට ශක්තිය ධෛර්යය සහ දේව ආශිර්වාදය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාගේ දේවස්ථාන කාර්යභාරය සහ ආගමික සංහිඳියාව තුළ

හැසිරීම සහ දායකත්වය මෙන්ම කැපවීම ඉතාමත් අගය කරන බව ප්‍රකාශ කරන ලදී. ලැබී ඇති සම්මානය ඉතාමත් වටිනා සම්මානයක් බවත් විපක්ෂනායකතුමා කොළින්ජාඩියට උරුමයද ලබා ගත් බවත් ප්‍රකාශ කරන ලදී. තමන් ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතාට වඩාත් සමීප වනුයේ එතුමාගේ ආදරණීය මාමණ්ඩිය වූ විශ්‍රාමික විදුහල්පති නැසීගිය විලියම් ප්‍රනාන්දු මහතා සමඟ බවත් තමන් එතුමාගේ ගෝලයෙකු වූ බැවින් බොහෝ කලක පටන් ඔවුන්ව හඳුනන බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රි ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා මෙන්ම එතුමාගේ මාමණ්ඩියද කතෝලික සභාවට සහ දේවස්ථාන කාර්ය භාරය සඳහා ඉතාමත් විශාල කාර්ය භාරයක් කල බවත් ප්‍රකාශ කරන ලදී.මෙතුමා සිදු කරන ආගමික සේවාව සහ සමාජීය සේවාව අගය කල යුතු බවත් ශිෂ්‍යත්වය තුළ ජීවත් විය හැකි පරිසරක් එම දරුවන් සමඟ නිර්මාණය කරන දේවස්ථාන භූමිකාව තුළත් එතුමන්ට සුභ පතන බවත් ප්‍රකාශ කරන ලදී.අද දින මෙය දැනගැනීමට ලැබීම සතුටක් බවත් කණ්ඩායම් හැඟීමෙන් යුතුව සඳහන් කරන බවත් පවසමින් තම කතාව අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ලෙනාඩ් දීමස් ප්‍රනාන්දු මහතා සියළු දෙනාගෙන්ම අවසර ගැනීමෙන් පසුව මේවා මීට වසර 300කට පමණ පෙර පූජ්‍ය පඬිවර ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචනා කරන ලද "පසම්" හා "ලතෝනි" ගීතිකා බවත්, එතුමා විසින් සංගීතය සටහන් කර නොතිබූ බවත් පදවිය පුරා ගී 70ක් පමන සොයාගෙන ඒවා රෙකොඩ් කර සංගීතය අළුතින්ම ලියා මෙය සිදු කල බවත්, සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් පසම් සඳහා ස්වර ලියූ ලොව පළමු වතාව බවත් එම භාග්‍ය දෙවියන් වහන්සේ විසින් ලබාදුන් බවත් ප්‍රකාශ කරන ලදී.මෙය කිසිවෙකු නොසිතූ බවත් ෆ්‍රැන්ක් තිසේරා පියතුමා සහ ලාල් පුෂ්පදේව පියතුමා එමෙන්ම ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුවද මේ සඳහා තමන්ට ඉතාමත් සහය වූ බවත් එම සියළුම දෙනාටද අද දින සභාවේදී තමන්ව අගය කිරීම සම්බන්ධයෙන් සියළුම දෙනාට තම ස්තූතිය පුද කරමින් තම කතාව අවසන් කරන ලදී.

04. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නයිනමඩම කොට්ඨාසය හා දංකොටුව කොට්ඨාසය සඳහා අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස ආධාර බෙදා දීම පසුගිය දිනක සිදු කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් කොට්ඨාසභාර ගරු මන්ත්‍රීවරුන් දෙපලටද ප්‍රජා කමිටු සභාපතිතුමා ඇතුළු කමිටු සාමාජිකයින් සියළුම දෙනාටද ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ටද ස්තූතිය පුද කරන ලදී.

05. 2022 කාන්තා දිනයට සමගාමීව කහටවිල මහජන පුස්තකාලයේ ගෙවතු වගාව සිදු කිරීම සහ කාබනික පොහොර නිෂ්පාදනය පිළිබඳ දැනුවත් කිරීමේ වැටසටහනක් ද, ලුණුවිල මහජන පුස්තකාලය මඟින් කේශ වර්ධන තෛලයක් සැකසීමේ වැඩමුළුවක්ද පැවැත්වීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

06. 2022 මාර්තු මස පහත සඳහන් මාර්ග වල වලවල් ප්‍රිමික්ස් අතුරා සංවර්ධනය කිරීමට හැකි වූ බවත් ඒ සඳහා සහයෝගය ලබා දුන් සියළුම දෙනාට ගරු සභාපතිතුමා ස්තූතිය පුද කරන ලදී.

- දංකොටුව කාර්සිසෙට්ටිවත්ත පාර
- හාල්දඩුවන සෙරෙප්පු වත්ත පාර පාර
- මැන් රෝසා පාර දුම්මලකොටුව
- කිරිමැටියාන පාසල අසල මාර්ගය
- කිරිමැටියාන පාසල අසල මාර්ගයේ කෙලවර
- මෝරුක්කුලිය පල්ලිය පාර
- වයික්කාල කරුණාකරලා හෝටලය අසල පාර
- කිරිමැටියාන පිං ළිඳ පාර
- කිරිමැටියාන පිං ළිඳ පාර (දෙවන අදියර)
- දික්වෙල මැද ගොඩැල්ල පාර
- ධර්මසිරි මහතාගේ නිවස අසල මාර්ගය
- කම්මල කොරියන් සිංහ ගම්මාන මාර්ගයේ කොටසක්

## 03.යථා පරිදි කල් දී ඇති යෝජනා

### a. ගරු සභාපතිතුමාගේ යෝජනා

i. පහත සඳහන් ගිණුම් අංක යටතේ බීකන් විදුලි පහන් ලබා ගැනීම හේතුවෙන් පැහැර හැර ඇති රු.600,702.44 ක මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් සමථ මණ්ඩලය මඟින් දැනුම් දී ඇති අතර ඒ සඳහා තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී.මෙය ඉතාමත් අතීතයේ වෙරළ තීරයේ ප්‍රදේශ සඳහා ලබා දුන් බවත් හිටපු ගරු සභාපති හෙක්ටර් අප්පුහාමි මහතාගේ කාලයේදී මහා සභා අනුමැතියක් රැගෙන ඇති බවද එම ලියවිලි නොමැතිව ගෙවීමට නොහැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| ගිණුම් අංකය | හිඟ මුදල (රු.) |
|---|---|
| • 5004024408 | 143372.21 |
| • 5004084203 | 150175.61 |
| • 5004084106 | 150175.61 |
| • 5004084300 | 156979.01 |
| | 600702.44 |

මෙම ලිපිය පැමිණියද මේ සම්බන්ධයෙන් කිසිඳු තොරතුරක් නොදන්නා බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය විදුලි බල මණ්ඩලයට අයකරගන්නා මුදලක් බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. සිතාසියේ සත්‍ය තොරතුර තිබූ බවත්, මුහුදු කරයේ බීකන් බල්බ දමා ඇති බවත් අද වන විට ඒවා අළුත්වැඩියා කටයුතු සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදී. එහිදී මේ සඳහා වෙනම විදුලි රැහැන් ගන්නා ලෙස පවසා ඇති බවත් එහිදී සිදු වූ දෙය තමන් නොදන්නා බවත් තමන් මෙය සිතනා පරිදි පවසන බවත් නමුත් මේ පිළිබඳව සභාව නොදන්නේ නම් තමන්ට ගෙවීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.මෙම කටයුත්ත සමථ මණ්ඩලයට දමා ඇති බවත් මේ පිළිබඳව තොරතුරු දන්නේ නම් පවසන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී සැපයුමක් ලබා දීම සම්බන්ධයෙන් අය කිරීමක් පිළිබඳව මෙහිදී පවසන බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මේ පිළිබඳව ලිපි ලේඛන නොමැති දැයි ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

මුදල් ආරවුලක් ලෙස මෙහි සඳහන් කර තිබෙන බවත් පවසමින් ගරු සභාපතිතුමා සිතාසිය ගරු සභාවට කියවා ඉදිරිපත් කරන ලදී.

ආයතන ගිවිසගත් ලිපි ගොණුවක් සභාව සතුව නොමැති නම් කාරුණික වී එම ලිපි ලේඛන වල පිටපතක් සභාවට ලබාදෙන ලෙසට ඔවුන්ට පවසමුයැයි ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

තමන් සමථ මණ්ඩලයට නිලධාරීන් නොයවන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගිණුම් අංක 04ක් පිළිබඳව මෙහිදී සාකච්ඡා වන බවත් එම ගිණුම් අංක වලට අදාල ගිවිසුම් සභාව සතුව තිබේද සබාපතිවරයා අත්සන් කල ලේකන වලට අදාල ලිපි සභාවේ තිබේදැයිද ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.ඒවා ඉදිරිපත් කරන ලෙසත් එමෙන්ම මාස 03කට පමණ පෙර විසන්ධි කල බවට පවසන බවත් එසේ නම් එය විසන්ධි කලේ කෙසේදැයිද විමසා සිටින ලදී.

විශය භාර නිලධාරී ගිහාන් මහතා මේ පිළිබඳව තොරතුරු සොයාගෙන පැමිණි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.2006 එවා ඇති ලිපියක් මෙහි තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

2006 සිට අද වන තෙක් විදුලි බල මණ්ඩලය මඟින් කුමක් සිදු කරේදැයිද ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විමසා සිටින ලදී.

අප සභාව ගිවිසුම් ගත වී නම් මිලදී ගෙන නම් කාරුණික වී එම ලිපි ගොණුව ලබා දෙන ලෙසට පවසන ලෙසත්,ඒ අනුව එය සභාවට ඉදිරිපත් කර තීරණයක් ගනිමුයැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම ගිනුම් අංක තමන් නොදන්නා බවත් නමුත් සියළුම තොටුපල වල් වල මේවා ක්‍රියාත්මක බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. බිල්පත් කිසිවක් නොලැබී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

බිල්පත් එකක් හෝ ලැබිය යුතු බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

මෙය ධීවර ප්‍රජාවට අනුකම්පා කර සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව ධීවරයන්ට විදුලි බිල් ගෙවීමට පැවසූවද අප සභාව මඟින් මෙය ගෙවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මේත් සමඟම බිල් ගෙවීමට පවසන කතාව පැමිණෙන බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

සමථ මණ්ඩලයට නිලධාරියෙකු යවා එහිදී ලිපිලේඛණ ඉල්ලා ගැනීමට පවසමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

සමථ මණ්ඩලය මඟින් සමථ නොවුනහොත් ඊළඟට උසාවියට දමන බවත් එතරම් දුරට නොයා සමථ මණ්ඩලය මඟින්ම මෙය විසඳගමුයැයිද ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මෙහිදී මාර්තු 26 වන දින සමථ මණ්ඩලයට කැඳවා ඇති බවත් එදින සහභාගී වුවාදැයිද ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා විමසා සිටින ලදී.

එදින සහභාගී නොවූ බවත් දිනයක් ඉල්ලා ගැනීමට හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 05<br><br>වෙරළ තීරයේ වසර ගණනාවකට පෙර බීකන් විදුලි පහන් සවි කිරීමට අදාලව විදුලි බල මණ්ඩලය වෙත නොගෙවා ඇති රු.600,702.44 ක මුදලක් අයකර ගැනීම සඳහා සමථ මණ්ඩලය මඟින් සිදු කර ඇති කැඳවීම පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කල මහා සභාව මීට අදාල සියළු තොරතුරු විදුලි බල මණ්ඩලයෙන් ලබාගෙන මීලඟ සභා වාරයකට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු බව මහා සභාව විසින් ඒකමතිකව තීරණය කරන ලදී. |

ii. ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ සහ ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණ පරිශ්‍රය තුළ සූර්ය බල ශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ගරු මහා සභාවේ එකඟතාවය ලබා ගැනීමට ගරු සභාපතිතුමා ගරු මහා සභාවට යෝජනා කරන ලදී. මේ සම්බන්ධයෙන් කමිටුවේ සාකච්ඡා කර ඇති බැවින් ඒ පිළිබඳව විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ලෙසට ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව කමිටුවේ මෙය සාකච්ඡා කල අවස්ථාවේදී එම වාර්තාව ඉදිරිපත් කල බවත්, මෙහිදී දංකොටුව නගර ශාලාව, ප්‍රධාන කාර්යාලය සහ ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණය යන ස්ථාන වල ස්ථාපිත කිරීමට එකඟතාවයකට පැමිණි බව ප්‍රකාශ කරන ලදී. නමුත් අදාල යෝජනාව ඉදිරිපත් කල ආයතනය මඟින් එය පරීක්ෂා කර බලා ලබා ගත හැකි විදුලි ධාරිතාවය සහ පද්ධතිවල වෙන් කල හැකි ධාරිතාවය අනුව දංකොටුව නගර ශාලාව තවමත් ආරම්භ කර නොමැති බැවින් විදුලි බිල ආවරණය කර ගැනීමට සහ බැංකු ණය මුදල ගෙවීමට හැකි වන පරිදි ප්‍රධාන කාර්යාලයේ ලයින් දෙකකින්ද ක්‍රීඩාංගණයේ ට්‍රාන්ස්ෆෝමරය සම්පූර්ණ පද්ධතියට ඇතුළු කල හැකි බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මෙම වාර්තාව සකස් කර සභාවට ඔවුන් ලබා දුන් බවත් මෙහි තොරතුරු ඇතුළත් වී තිබෙන බවත් වසර 06කින් ණය මුදල ගෙවිය යුතු බවත් වසර 10කට වගකීම් කාලයක් තිබෙන බවත් වසර 10න් පසුව ගිවිසුම් ගත වී නඩත්තුවට යා යුතු බවත් ප්‍රකාශ කරන ලදී. රක්ෂණය

සම්බන්ධයෙන්ද එහිදී ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විමසූ විට පළමු වසර නොමිලයේ රක්ෂණය කර ලබාදෙන බව පැවසූ බවත් මුළු පද්ධතියම රු.150,000.00 මුදලකට ඉන් පසුව සිදු කර දෙන බව පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී.

විදුලි බිලේ මුදලින් අදාල ණය මුදල ගෙවා ගෙන යා හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

විදුලි බිල්පත බිංදුව වන බවත්, වසර 06කින් පසුව සම්පූර්ණ මුදලම අදායමක් ලෙස ලැබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සඳහා තීරණයක් ගත යුතු බවත්, මෙය අනිවාර්යයෙන්ම සිදු විය යුතු බවත්, පිළිබඳව වසර දෙකක සිට කතා කලද කිසිවෙකු හැරී නොබැලූ බවත් තමන් අතිගරු ජනාධිපතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කල පසුව සභාවට මොවුන් පැමිණ කතා කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ලංකා බැංකුවෙන් ණය ලබාදෙන බවත් ණය වාරිකය සභාවට බරක් නොවන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

විදුලි බල මණ්ඩලයද මේ සඳහා සහයෝගය ලබා නොදුන් බවත්,සභාවේ කාලය අවසන් වන තෙක් කතා කලා පමණක් බවත් මෙවැනිම සිදු වීමක් පසුගිය කාලයේදීද සිදු වූ බවත් ත්‍රීවීලර් රථ ගැනීමට මුදල් වෙන් කල බවත් අවසානයේ මුදලද නැති වී ගිය බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. පසුගිය කාලයේ 4% පොළී ප්‍රතිශතයකට ලංකා බැංකුව මඟින්ණය නිකුත් කර තිබූ බවත්, මේ වන විට 9.6% දක්වා එම ප්‍රතිශතය වැඩි වී ඇති බවත් මෙම කටයුත්ත මෙතෙක් කල් කල් දැමූ බැවින් මෙම ණය මුදල මෙම පොළී ප්‍රතිශතයට ගැනීමට සිදු වන බැවින් දැන් හෝ සභාවට බරක් නොවී මෙය ගෙවා ගෙන යා හැකි බැවින් ඉක්මනින් සිදු කරමුයැයිද ඉදිරි මාසයේදී ක්‍රියාත්මක කරමුයැයිද යෝජනා කරන ලදී.

මෙහි ප්‍රගතිය ඊළඟ මස මහා සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.මෙම වැඩ කටයුත්ත ආරම්භ කරන ලෙසටද ලේකම්මහතාට දැනුම් දෙන ලදී.

යෝජනා සම්මත කලද ඉන් පසුව ඒවා පිළිබඳව පසු විපරමක් සිදු නොවන බවත්,සෑම මහා සභාවකම න්‍යාය පත්‍රයට මෙහි ප්‍රගතිය ඉදිරිපත් කිරීම පිණිස ඇතුළත් කරන ලෙසටද ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී. ජල පිරිපහදු ඒකකයේ වැඩ කටයුතුද මේ සමඟම සිදු කරගෙන යන ලෙසටද ඉල්ලා සිටින ලදී.

මෙය ක්‍රියාත්මක කිරීමේදී ගැටළු තිබේනම් මෙම මහා සභාවට ඒවා ඉදිරිපත් කර අවශ්‍ය අනුමැතිය ලබා ගන්නා ලෙසටද ලේකම්මහතාට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 06

ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ සහ ශ්‍රීමත් ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණ පරිශ්‍රය තුළ සූර්ය බල ශක්ති පද්ධතියක් ස්ථාපිත කිරීම සුදුසු බවටත් හැකි ඉක්මනින් එය සිදු කිරීම යෝග්‍ය බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

## b.ගරු මන්ත්‍රී යෝජනා

**i.** කම්මල කොට්ඨාසයේ 481/ඒ, අලුත්තොට ග්‍රාම නිලධාරී වසමේ මඩු මාතා මාවතේ දකුණට ඇති පළමු අතුරු මාර්ගය සහ 481/ඩී , ද/කම්මල ග්‍රාම නිලධාරී වසමේ කම්මල මං සන්ධියේ සිට ඩොල්පින් හෝටලය දෙසට ඇති ප්‍රධාන මාර්ගයේ වමට ඇති මැණිකා උළු කම්හල අසලින් ඇති අතුරු මාර්ගය යන මාර්ග 2022 වර්ෂය සඳහා කම්මල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන වැය කර තාර යොදා සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 07<br><br>කම්මල කොට්ඨාසයේ 481/ඒ, අලුත්තොට ග්‍රාම නිලධාරී වසමේ මඩු මාතා මාවතේ දකුණට ඇති පළමු අතුරු මාර්ගය සහ 481/ඩී , ද/කම්මල ග්‍රාම නිලධාරී වසමේ කම්මල මං සන්ධියේ සිට ඩොල්පින් හෝටලය දෙසට ඇති ප්‍රධාන මාර්ගයේ වමට ඇති මැණිකා උළු කම්හල අසලින් ඇති අතුරු මාර්ගය යන මාර්ග 2022 වර්ෂය සඳහා කම්මල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන වැය කර තාර යොදා සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා **යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

ii. 2022 වර්ෂය සඳහා ගෝනවිල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන මුදලින් ගෝනවිල කොට්ඨාසයේ ගෝනවිල පොදු වෙළඳපොල පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 08<br><br>2022 වර්ෂය සඳහා ගෝනවිල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන මුදලින් ගෝනවිල කොට්ඨාසයේ ගෝනවිල පොදු වෙළඳපොල පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී එච්.ඒ.ක්ලීටස් පෝල් පෙරේරා මහතා **යෝජනා කල අතර එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

iii. 2022 වර්ෂය සඳහා ලුණුවිල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන මුදලින් සිරිගම්පල සතිපොළ පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සලකා බැලීම.

| |
|---|
| **තීරණ අංක 09**<br><br>2022 වර්ෂය සඳහා ලුණුවිල කොට්ඨාසයට වෙන්කර ඇති ප්‍රතිපාදන මුදලින් සිරිගම්පල සතිපොළ පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විසින් යෝජනා කල අතර **එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

**iv.** ලුණුවිල හංදියෙන් පහළවත්ත පාරින් ආරම්භ වී අමිලා රසාංගි මහත්මියගේ නිවස අසලින් අවසන් වන "පහළ වත්ත පළමු අතුරු මාර්ගය" සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සලකා බැලීම.

| |
|---|
| **තීරණ අංක 10**<br><br>ලුණුවිල හංදියෙන් පහළවත්ත පාරින් ආරම්භ වී අමිලා රසාංගි මහත්මියගේ නිවස අසලින් අවසන් වන "පහළ වත්ත පළමු අතුරු මාර්ගය" සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රිනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය යෝජනා කල අතර **එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී. |

v. ඩිපෝපාර දකුණ පස දෙවන හරස් පටු මග සඳහා නාම පුවරුවක් නොමැති බැවින්ද, ඒ සඳහා නැසී ගිය ආර්.පී.ඩී.ජෝෂප් කුවින්ටස් රත්නායක මහතාට පාරම්පරිකව මාර්ගයේ සම්පූර්ණ අයිතියද ඇති බැවින්

එම මාර්ගය ''රත්නායක මාවත'' ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව සලකා බැලීම.

**තීරණ අංක 11**

ඩිපෝපාර දකුණ පස දෙවන හරස් පටු මහ සඳහා නාම පුවරුවක් නොමැති බැවින්ද, ඒ සඳහා නැසී ගිය ආර්.පී.ඩී.ජෝෂප් කුවින්ටස් රත්නායක මහතාට පාරම්පරිකව මාර්ගයේ සම්පූර්ණ අයිතියද ඇති බැවින් එම මාර්ගය ''රත්නායක මාවත'' ලෙස නම් කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා යෝජනා කල අතර **එම යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

vi. උදාසිරිගම කොට්ඨාසයේ 2022 වර්ෂය සඳහා සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග වලට අමතරව පහත සඳහන් මාර්ගද ඇතුළත් කර සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

- උදාසිරිගම ග්‍රාම නිලධාරී වසමේ 6 වන සහ 5 වන හරස් මාර්ග සම්බන්ධ වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
- උතුරු සිරිගම්පල ගාම නිලධාරී වසමේ තෙරේසාවත්ත පල්ලිය පිටුපස හරස් මාර්ගය නවීකරණය කිරීම

ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මෙය සෞභාග්‍යයේ දැක්මට යෝජනා කර තිබූ බවත්, එක් මාර්ගයකට බොරළු සහ අනෙක් මාර්ගයට ABC ටිකක් දමා ඇති බවත් මුදල් නොලැබුණ බැවින් මෙම කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූ බවත් එබැවින් මෙයට ප්‍රමුඛතාවය දී සිදු කරගැනීමට අනුමැතිය ලබාදෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

තීරණ අංක 12

උදාසිරිගම කොට්ඨාසයේ 2022 වර්ෂය සඳහා සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග වලට අමතරව පහත සඳහන් මාර්ගද ඇතුළත් කර සංවර්ධනය කර දෙන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

- උදාසිරිගම ග්‍රාම නිලධාරී වසමේ 6 වන සහ 5 වන හරස් මාර්ග සම්බන්ධ වන අතුරු මාර්ගය සංවර්ධනය කිරීම
- උතුරු සිරිගම්පල ගාම නිලධාරී වසමේ තෙරේසාවත්ත පල්ලිය පිටුපස හරස් මාර්ගය නවීකරණය කිරීම

vii.උතුරු මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ බොරලැස්ස ලුණුවිල මාර්ගයෙන් පී.නිකුලස් ප්‍රනාන්දු යන අයගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන ඇති අතර එම පාර '' ගරු සහෝදර ජෝනස් කෘෂස් මාවත '' නමින් නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 13

උතුරු මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ බොරලැස්ස ලුණුවිල මාර්ගයෙන් පී.නිකුලස් ප්‍රනාන්දු යන අයගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන ඇති අතර එම පාර '' ගරු සහෝදර ජෝනස් කෘෂස් මාවත '' නමින් නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික

අනුමැතිය ලබා දෙන ලදී.

viii.මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ මාකස් මහතාගේ නිවස අසලින් ආරම්භ වී ස්ටැන්ලි මහතාගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර එකී පාර " ලූර්දු මාවත " ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 14

මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ මාකස් මහතාගේ නිවස අසලින් ආරම්භ වී ස්ටැන්ලි මහතාගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර එකී පාර " ලූර්දු මාවත " ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී

Ix. නැගෙනහිර බොරලැස්ස ග්‍රාමසේවා වසමේ එම්මානුවෙල් මහතාගේ නිවස අසලින් ආරම්භ වී අයිවන් මහතාගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 15

නැගෙනහිර බොරලැස්ස ග්‍රාමසේවා වසමේ එම්මානුවෙල් මහතාගේ නිවස අසලින් ආරම්භ වී අයිවන් මහතාගේ නිවස අසලින් අවසන් වන පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී

x. දකුණු මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ ලුණුවිල-බොරලැස්ස මාර්ගයෙන් ආරම්භ වී ක්‍රිස්තුරාජ මාවතින් අවසන් වන වැලි පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර එකී පාර " වැලිපාර පළමු පටුමඟ " ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** සලකා බැලීම.

තීරණ අංක 16

දකුණු මිරිස්සන්කොටුව ග්‍රාමසේවා වසමේ ලුණුවිල-බොරලැස්ස මාර්ගයෙන් ආරම්භ වී ක්‍රිස්තුරාජ මාවතින් අවසන් වන වැලි පාර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නඩත්තු කර එකී පාර " වැලිපාර පළමු පටුමඟ " ලෙස නම් කර දෙන ලෙසට ගරු මන්ත්‍රිනී ආර්.නිරෝෂා ජීවන්ති ප්‍රනාන්දු මහත්මිය විසින් **ඉදිරිපත් කර ඇති යෝජනාව** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී

## **04. කාරක සභා වාර්තා සලකා බැලීම.**

i. 2022.03.21 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සලකා බැලීම.

තීරණ අංක17

2022.03.21 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ආර්.පී.අකිල ශිරංග රාජපක්ෂ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී.

ii. 2022.02.18 / 2022.03.04 හා 2022.03.18 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සලකා බැලීම.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තිබෙන රේට්ස් අනුව කොන්ත්‍රාත්කරුවන්ට වැඩ කටයුතු කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව ප්‍රකාශ කරන ලදී.

මේ සතියේ නව රේට්ස් ගණන් සහිත පොත ලැබෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ලබන සතිය වන විට නැවත මිල ගණන් වැඩි වුවහොත් තවත් රේට්ස් පොතක් එවීමට සිදු වන බවත් එබැවින් මේ සඳහා පවතින මිල ගණන් යටතේ දෙයක් කරන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

පරණ රේට්ස් වලට ගිවිසුම්ගත වී ඇත්නම් ඒ අනුව කටයුතු කරන ලෙසට මේ වන විට දැනුම් දී ඇති බවත් නමුත් එලෙස කිසිවෙකු කටයුතු නොකරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොන්ත්‍රාත්කරුවන් ස්වාධීන බවත්, එතැනින් එහාට අප කුමක් කරන්නේදැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා විමසා සිටින ලදී.

නඩු දැමිය හැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කොන්ත්‍රාත්කරුවන් ගෙන්වා සාකච්ඡාවක් සූදානම් කරමුයැයිද ඔවුන්ගේ ප්‍රායෝගික ගැටළුද සාකච්ඡා කරමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.ණයගිම් අත්සන් කල ගිවිසුම්ද තිබෙන බවත් එම කටයුතුද කරගැනීමට නොහැකි වී ඇති බැවින් කොන්ත්‍රාත්කරුවන්ව ඉන්මනින්ම කැඳවමුයැයිද ප්‍රකාශ කරන ලදී.

ඊළඟ කර්මාන්ත කමිටුව වෙත කොන්ත්‍රාත්කරුවන් කැඳවන ලෙසට ගරු සභාපතිතුමා දැනුම්දෙන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තමන්ට අදහසක් ඉදිරිපත් කිරීමට තිබෙන බවත් වැඩිවන මිල ගණන් අනුව සාපේක්ෂව ප්‍රතිශය වැඩි වීම සම්බන්ධයෙන් මහා සභාවෙන් තීරණයක් ගත හැකිදැයිද විමසා සිටින ලදී. නැතිනම් අනුමැතිය ගෙන පැමිණෙන විට මිල ගණන් නැවත වැඩි වන බවත් ප්‍රකාශ කරන ලදී.

රේට් පොතක් ලැබුන පසුව එය මාස තුනක්වත් පාවිච්චි කල යුතු බව තමන් පවසන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.ගිවිසුම අත්සන් කල පසුව කොන්ත්‍රාත්කරුවන් එම එකඟවූ රේට් එකට වැඩ කලයුතු බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

රේට් පොතේ තිබෙන ගණන් තවමත් නොදන්නා බවත්,පාලනය කල හැකි දේ මෙන්ම පාලනය කල නොහැකිදේද තිබෙන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගිවිසුම අත්සන් කිරීමේදී කාලයක් ලබා දෙමුයැයි ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

කොමසාරිස්තුමා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමා විසින් ගරු මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

කර්මාන්ත කමිටුවට කොන්ත්‍රාත්කරුවන් ගෙන්වා මේ අනුව කටයුතු කරන ලෙසට ඔවුන්ට පවසමුයැයි ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

සභාවේ කොන්ත්‍රාත්වලට අවශ්‍ය වන අමුද්‍රව්‍යය ගෙනැවිත් ගබඩා කර ඒවා අවශ්‍ය විට අදාල කොන්ත්‍රාත්කරුවන්ට ලබා දෙමුයැයි තමන් අදහසක් ඉදිරිපත් කරන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

එය සභාවට සිදු කල නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව තවත් ගැටළුවක් තිබෙන බවත් කොන්ත්‍රාත්කරුවන් නොව සමිති ගිවිසුම්ගත වී ඇති බවත් එබැවින් සභාවට කොන්ත්‍රාත්කරුවෙකුට විරුද්ධව කටයුතු කිරීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

සමිති නොමැතිව සිදු කරමුයැයි ද, මේ සියල්ල කර්මාන්ත කමිටුවට ගෙන්වා සාකච්ඡා කරමුයැයිද ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.සෑම කොට්ඨාසයකම සමිතියක් පිහිටුවා තිබුනේනම් මෙය සිදු කිරීමට හැකි බවත්, සමිතියට 1% ලබා දීමට හැකි බවත් කොට්ඨාස 25ම සමිති පිහිටුවන ලෙසද ප්‍රකාශ කරන ලදී.

| |
|---|
| තීරණ අංක 18 |
| 2022.02.18 / 2022.03.04 හා 2022.03.18 වන දින පැවති මාර්ග,ඉඩම්,ගොඩනැඟිලි හා කාර්මික සේවා කාරක සභා වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මියගේ සහ ගරු මන්ත්‍රී ඩබ්.ඒ.රෙන්ෆ්‍රිඩ් ෂවීන් ප්‍රනාන්දු මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවල සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී |

iii. 2022.03.24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම.

| |
|---|
| තීරණ අංක 19 |
| 2022.03.24 වන දින පැවති පරිසර සහ මහජන සෞඛ්‍ය පහසුකම් සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ සහ ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී. |

iv. 2022.03.24 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සලකා බැලීම

| |
|---|
| තීරණ අංක 20 |
| 2022.03.24 වන දින පැවති ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු උපසභාපති ආර්.ඒ.නිලංක සඳකැල් මහතාගේ සහ ගරු මන්ත්‍රී කේ.නොඑල් සුදත් ජානක පෙරේරා |

මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සහා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

v. 2022.04.01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සලකා බැලීම

ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව ලුණුවිල ගොඩනැඟිල්ලේ කායවර්ධන මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට ගිවිසුම අත්සන් කලේදැයි විමසා සිටින ලදී.

කමිටුව මඟින් අවසරය ලබා දුන් බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

නර්ථන ගුරුතුමියගේ සහ මෙම මධ්‍යස්ථානයේ ඉඩකඩ මේ වන විට සලකා බලමින් සිටින බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙහි ලිහිරියාගම හා කිරිමැටියාන සතිපොල සඳහා 2020/2021 වර්ෂ වෙනුවෙන් සහන ලබාදීම පිළිබඳව මහා සභාවට යොමු කර ඇති බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

විවිධ කාල වකවාණුවල රටේ ඇති වූ තත්ත්වයන් සම්බන්ධයෙන් සඳහන් වන බවත්, කොවිඩ්-19 වසංගතයත් සමඟ පොළ වසා තිබූ කාල පරිච්ඡේදය තුළ පොළ ටෙන්ඩර්ගත් පුද්ගලයාට සහනයක් ලබාදෙන ලෙසට ඉල්ලා ඇති බවත්, මෙය කොමසාරිස්තුමාට යවා අනුමැතියක් ගත යුතු බවත් මෙය වංචාවක් නොවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 21

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ආදායම් පහළයාම මත ලිහිරියාගම හා කිරිමැටියාන සතිපොළවල් වල බදු කුලී සහනයක් ලබා දෙන ලෙස අදාල බදුකරුගේ ඉල්ලීම අනුව සභාවේ ආදායම් පරීක්ෂකවරුන්ගේ නිර්දේශ මත 2020 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා මාසික කුළියෙන් 50% ලෙස කිරිමැටියාන සතිපොලට රු.51,484.00ක්ද, ලිහිරියාගම සතිපොලට රු.25,654.00ක්ද වශයෙන් රු.77,138.00ක් සහ 2021 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා ඇමුණුමේ සඳහන් පරිදි කිරිමැටියාන සතිපොලට රු.241,000.00ක්ද, ලිහිරියාගම සතිපොලට රු.76,000.00ක්ද වශයෙන් රු.317,000.00ක සහනයක් ලබා දීමට ගරු පලාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා යෝජනා කල අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ස්ථිර කරන ලදී.ඒ අනුව ඒ සඳහා ගරු මහා සභාවේ ඒකමතික අනුමැතිය ලබා දෙන ලදී.

ජල මූලාශ්‍ර සමිතියකින් ලිහිරියාගම මෙම භූමියේ තිබෙන ළිඳෙන් පානීය ජලය ඉල්ලා ඉල්ලීමක් කර්මාන්ත කමිටුවට යොමු කර තිබූ බවත්, එය මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට පැවසූ බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.
ජලයේ ප්‍රමාණය මැනීමට ලක්ෂ 02ක් පමණ යන බවත්, එය සභාවෙන් ගෙවීමට අවසරය දෙන්නේ නම් අදාල නිලධාරීන් ගෙන්වා මැනුම් කටයුතු කල හැකි බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ඇල්බට් ඇෆ් පීරිස් ක්‍රීඩාංගණයේ නළ ළිඳෙන් මේ වන විට ජලය බවුසරයට ලබා දෙන බවත් ලීටර් 6500 බැගින් පස් වතාවක් ජලය පැටවූ පසුව ජලය අවසන් වන බවත් එමඟින් ක්‍රීඩාංගණයේද වැඩ කටයුතු කරන බවත් ලීටර් 3000 වැනි ට්‍රැක්ටර් රථයටත් ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදී.

පසුගිය සතියේ ලුණුවිල සතිපොලේ නළ ළිඳක් ඉදි කල බවත් නමුත් එම ඇස්තමේන්තුවේ ජල සාම්පල් පරීක්ෂා කිරීමක්, ධාරිතාව පරීක්ෂා කිරීමක් නොමැති බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එහිදි අවශ්‍ය වූයේ එම ස්ථානයේ භාවිතයට බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ළිඳක් ගැසීමේදී එය පානීය ජලයට සුදුසුද යන්න පරීක්ෂා කල යුතු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මෙම වාණිජ ගොඩනැගිල්ලේ ඇස්තමේන්තුව සකස් කිරීමේදී ජල පහසුකම් , සනීපාරක්ෂක පහසුකම් යනාදිය ඇතුව එය සකස් නොකලේදැයි ගරු මන්ත්‍රීනී ජේ.කේ.දීපා මේරි අයිරංගනී පෙරේරා මහත්මිය විමසා සිටින ලදී.

කර්මාන්ත කමිටුවට පොදු පහසුකම් කමිටුවට මෙය නොපැමිණි බවත් කාගේ උවමනාවට සිදු වූයේදැයිද,සභාවේ මුදල් වැය කරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

මේ සම්බන්ධව වාර්තාවක් ලබා දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

2022.03.18 දිනැති කර්මාන්ත කමිටු වාර්තාවේ තමන් පෙර පැවසූ කාරණය සඳහන් වන බවත්, එ පිළිබඳව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා විමසා සිටින ලදී.

මේ සඳහා ලක්ෂ 02ක පමණ මුදලක් වැය වන බවත් එය සභාවෙන් සිදු කරන්නේ නම් අවසරය ලබා දෙන්නේ නම් තමන් සිදු කර දෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් ලුණුවිල නළ ළිඳේද එය සිදු කර දෙන ලෙසට ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ප්‍රජා මූල සංවිධානයක් ඉල්ලීමක් කරන්නේ නම් එතැනින් එහාට එය පාලනය කරන්නේ කවුරුන්දැයිද, නඩත්තු කරන්නේ බිල්පත් ගෙවන්නේ කවුරුන්දැයිද ගැටළුවක් මතු වන බවත් එබැවින් සැලසුමක් ඇතිව මෙය සිදු කල යුතු බවත්, අවසානයේ පොළටවත් ජලය ලබා දීමට නොහැකි වුවහොත් කුමක් සිදු කරන්නේදැයිද ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී.

ජල සම්පත් මණ්ඩලයේ පැය 24 ම එක දිගට ජලය ලබා ගත හැකි ක්‍රමයක් තිබෙන බව ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

ඉහත සඳහන් කල ස්ථාන දෙකෙහිම ජල සාම්පල් පරීක්ෂාව සිදු කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රීනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ගරු සභාපතිතුමාගෙන් අවසර ලබා ගැනීමෙන් පසුව ධාරිතාව පරීක්ෂා කිරිමට ලක්ෂ 2ක් පමණ යන බව පැවසූ බවත්,නමුත් ප්‍රජා ශාලාවකට විදුලිය ලබා ගැනීමට මුදලක් සභාවෙන් ඉල්ලීමේදී එය මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබා ගන්නා ලෙස පැවසූ බවත් එබැවින් මෙම මුදලද අදාල මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ලබා ගන්නා ලෙසට ඉල්ලීමක් කනර බවත් ප්‍රකාශ කරන ලදී.

ජල සම්පත් වලට වෙනම මුදලක් වෙන් කර තිබෙන බවත්, විදුලිය සඳහා එලෙස වෙන් කර නොමැති බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

පොඩි දෙයක් ඉල්ලීමේදීද මුදල් නොමැති බව පවසන බවත්,නමුත් අනාගතයේදී මහායායවත්ත වැනි ප්‍රදේශ වලට ජලය ලබාදෙන ලෙස ඉල්ලීමක් කලහොත් එය ලබාදෙන ලෙසටද ගරු මන්ත්‍රිනී අයි.එච්.නයෝමි රම්‍යලතා මහත්මිය ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ජලය විකිණීමට යන බවත්, ආදාමක් ලැබෙන බැවින් ආයෝජනායක් කිරීම වරදක් නොවන බවත් ගරු මන්ත්‍රී ඩබ්.ඇලෙක්ස් නිශාන්ත ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

මීට වසර එක හමාරකට පමණ පෙර කළුවච්චිමුල්ල කඩපෙලේ නළළිදක් ඉදි කල බවත්, එහි ජලය හොඳින් තිබෙන බවත්, එතැන බවුසර් පොයින්ට් එකක් ගසා ජලය ලබා ගන්නා ලෙසත් ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී. ජල බවුසරයේ රියදුරුට පැමිණෙන විට දුරකථන ඇමතුමක් ලබාදෙන ලෙසට තමන් පැවසූ බවත් ඔවුන් නොසලකා හරින බවත් ප්‍රකාශ කරන ලදී.

තමන් එම දුරකථන ඇමතුම ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතාට ඊළඟ පැමිණෙන දිනයේ ලබාදෙන බවත් ඒ අනුව කටයුතු කරන ලෙසත් ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දුම්මලදෙණියේ තමාගේ නළළිදක් තිබෙන බවත්, ජලය අවශ්‍ය නම් තමන් එමගින් ජලය ලබා දීමට සූදානම් බවත් ගරු මන්ත්‍රී බී.ඒ.එස්.ශාන්ත පෙරේරා මහතා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 22

2022.04.01 වන දින පැවති පොදු පහසුකම් හා ආපදා කලමනාකරණ කාරක සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බව ගරු මන්ත්‍රී ඩබ්.ජෝන් බැප්ටිස් ප්‍රනාන්දු මහතාගේ සහ ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන් සභා සම්මත විය. ඒ අනුව එම වාර්තාවේ සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා මහා සභාවේ ඒකමතිකව අනුමැතිය ලබා දෙන ලදී

## <u>05.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම</u>.

**i. මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය -2022 ජනවාරි / 2022 පෙබරවාරි**

**ii. මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය -2022 ජනවාරි / 2022 පෙබරවාරි**

**ලැබීම් සාරාංශයේ වත්කම් අඩුවීම යටතේ අංක 168 ණය ගැතියෝ වාර්ෂිකව රු.160,949,797.48 ගණනක් තිබෙන බවත්, මෙම වාර්තාව ලබා දීමේදී වෙන් වෙන් වශයෙන් ණය ගැතියන් සඳහන් කර දුන්නේ නම් වඩාත් යෝග්‍ය බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.**

**එය වෙන් කර ලබා දෙන බව ගරුසභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

**පෙබරවාරි මස වාර්තා වල අය සහ වැය පරස්පරය සම්පූර්ණ වී තිබේදැයි** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතා විමසා සිටින ලදී. ණය ගැතියන් යන විෂයද තවත් වෙනස් විය යුතු නොවේදැයිද විමසා සිටින ලදී.

මාසය ගානේ ලැබී නොමැති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තීරණ අංක 23

2022 ජනවාරි මස සහ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා 2022 ජනවාරි මස

සහ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ ගෙවීම් සාරාංශය පිළිබඳ වාර්තා සත්‍ය වාර්තා බව ගරු මන්ත්‍රී ඒ.එස්.එම්. කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**iii. 2022 මාර්තු මස ඉන්ධන හා අළුත්වැඩියා වෙනුවෙන් වියදම් වූ වාර්තාව සලකා බලන ලදී.**

**iv. 2022 වර්ෂයේ වීථි පහන් නඩත්තු කිරීම පිළිබඳ ප්‍රගති වාර්තාව සලකා බලන ලදී.**

**මෙම වාර්තාවට විදුලි බල්බ වැය වූ කොට්ඨාසයද ඇතුළත් කරන ලෙස** ගරු මන්ත්‍රී කේ.නාමල් අනුරුද්ධ සිරිවර්ධන ප්‍රනාන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

දැනට කොට්ඨාස දෙකක දිනකට වැඩ කටයුතු කරන බවත් එය මෙහි සඳහන් කර තිබෙන බවත් ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

විදුලි අළුත්වැඩියා සිදු කරන කාල සටහන මේ වන විට නොලැබෙන බව ගරු මන්ත්‍රී සී.පී.සරත් වික්‍රමරත්න මහතා ප්‍රකාශ කරන ලදී.

එම දින වලටම අදාල කොට්ඨාස වෙත අළුත්වැඩියාවට නොයන බැවින් මෙම වාර්තාවේ දෛනික අළුත්වැඩියා කල කොට්ඨාසය සඳහන් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා 23 වන දින අසාමාන්‍ය බල්බ වැඩි වීමක් තිබෙන බවද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

එහිදී සටහන් කිරීමේ වරදක් සිදු වී ඇති බවත් එවැනි ගණනක් වැය නොවූ බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. කොට්ඨාසයකට බල්බ 20 පමණ රැගෙන යන බවත් බල්බ 101 කෙදිනකවත් රැගෙන නොයන බවත් ප්‍රකාශ කරන ලදී. අදාල නිලධාරියාගෙන් විමසා එය නිවැරදි කර දෙන බව ද තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

101 ලෙස සඳහන් ගණන ගනන් නොගෙන ගණනය කලහොත් මාසිකව බල්බ 422 වැය වී ඇති බවත්, 23 වන දින එතරම් බල්බ ප්‍රමාණයක් වැය නොවී ඇති බවත් මෙහිදී ගැටළුව වන්නේ 523 ලෙස ගෙන වැය වූ මුදල රු.339,950.00 ලෙස සඳහන් ගණන සංශෝධනය විය යුතු බවත් ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතා ප්‍රකාශ කරන ලදී. 523 ලෙස වුවද කොට්ඨාසයක් සඳහා බල්බ 21 පමණක් වැය වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

විශාල මුදලක් මේ වන විට ඉතිරි වන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තවමත් නිවා නොදමන විදුලි බල්බ තිබෙන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

විදුලි වාර්තාවේ සටහන් කිරීමේදී මුද්‍රන දෝශයක් තිබෙන බවත් එය 101 ලෙස නොව 10 ලෙස සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී යූ.ජූඩ් එම්මානුවෙල් මහතා ප්‍රකාශ කරන ලදී.

එසේ නම් මුළු මුදලද සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රීවරුන් අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලදී.

## <u>06. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.</u>

(i). ගරු මන්ත්‍රී ඩී.නිමල් අරුණ ශාන්ති විජේතුංග මහතා ගරු සභාපතිතුමා ඇතුළු සියළුම දෙනාගෙන් අවසර ගැනීමෙන් පසුව අද දින සාකච්ඡා කරමින් පවත්වන මෙම මහා සභා රැස්වීම 50 වන මහා සභා රැස්වීම බවත්, එමෙන්ම මීට වසර 4කට පෙර පටන් ගත් මෙම සභා වාරයේ පළමු දින සිට නොයෙක් දේ මෙම සභාව තුළ සාකච්ඡා කල බවත් විශාල වැඩ කොටසක් සිදු කර ඇති බවත්, වයඹ අභිමානය යන නාමය රැගෙන ඇති බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මන්ත්‍රීවරයෙකු වශයෙනුත් එමෙන්ම පුරවැසියෙකු වශයෙන් ඉතාමත් හිතේ අමාරුවෙන් තමන් අද ජීවත් වන බවත් මන්ද නොයෙකුත් දේ උදේ සිට කතා කලද රටේ මහජනතාව අද වන විට පත් වී ඇති අර්බුදකාරී තත්ත්වය කෙසේද ඒ සඳහා අප දායකත්වය ලබාදිය හැක්කේ කෙසේදැයිද යන්න පිළිබඳව කිසිවෙකු තවමත් කතා නොකල බවත් මෙහිදී ඒ සඳහා ප්‍රවේශයක් තමන් ගෙන දෙන බවත් ප්‍රකාශ කරන ලදී.අද මේ රටට කුමක් සිදු වී

ඇත්දැයිද සියළුම දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජනතාව පාරට බැස උද්ඝෝෂණ කරමින් ඉල්ලන්නේ මොනවාදැයිද දන්නා බවත්, අද වන විට විදුලිය නොමැති බවත්, කිරිපිටි,ඩීසල්,බෙහෙත්,ගෑස් නොමැති බවත්, මෙම කතාව වෛරයක් ,රණ්ඩුවක් කරා ගෙන යාමට අවශ්‍ය නොවන බවත් නමුත් අධූරදර්ශී මෙන්ම කලමනාකරණය පිළිබඳව කිසිදු හැකියාවක් නොමැති කණ්ඩායමක් විසින් මෙය සිදු කල බවට තමන් මෙය දකින බවත් ප්‍රකාශ කරන ලදී.ජනතාව අද නොකා නොබී ඇඬු කඳුලින් ජීවත් වන තත්ත්වයක් උදා වී ඇති බවත්, අප ප්‍රදේශයේ ජනතාවට කුළියට හෝ රැකියාවක් කල හැකි බවත් නමුත් ඇතුල් ප්‍රදේශ වලට යන විට ඒ කිසිවක් නොලැබෙන බවත් තමන් මන්ත්‍රීවරයෙකු වශයෙන් ඉතාමත් කණගාටුවට පත් වන බවත්, දේශපාලඥයින්ට ජනතාවගෙන් එල්ල වී ඇති විවේචන දෙස බැලීමේදී තමන් මන්ත්‍රීවරයෙකු ලෙස පැවසීමට නොයන බවත් ලැජ්ජා බවත් ප්‍රකාශ කරන ලදී.තමන් කිසිවෙකුට ඇඟිලි දික් කර චෝදනා නොකරන බවත්, උගත් මන්ත්‍රීවරුන් මෙහි සිටින බවත් එබැවින් මෙහි වරද කාගේදැයි සිතා බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී. මීට වසර 2කට පෙර කිසිදු අග හිඟයක් නොතිබූ බවත්, අද වන විට බැංකු වල ඩොලරය රු.320.00ට මාරු වන බවත් පිටින් රු.400.00ට මාරු වී යන බවත් ප්‍රකාශ කරන ලදී.ලෝකයේ මුදල් වලින් රුපියල ඉතාමත් බාල් දූ වී ඇති බවට පවසන බවත් තමන් වැඩිදුර කතා නොකරන බවත් මේ පිළිබඳව අපට කල හැකි දේ පිළිබඳව සාකච්ඡා කරන ලෙසටද ඉල්ලා සිටිමින් තම කතාව අවසන් කරන ලදී.

(iii) ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව, 2020 දෙසැම්බර් මස තීරණයක් ගෙන නගර සීමා ලකුණු කල බවත්, මේ වන විට කිසිදු එලවළු කඩයක් හෝ සිල්ලර කඩ දැමීමට ඉඩ ලබා නොදෙන බවත්, මේ වන විට නගර සීමාවේ ක්‍රියාත්මක වන එලවළු කඩ, සිල්ලර කඩ නොමැති දැයිද, ඒවා තිබේ නම් ගැසට් නිවේදනය අනුව නඩු දමා තිබේදැයිද විමසා සිටින ලදී.අල ලූණු සිල්ලර කඩවල සහ තොග කඩ වල විකුණන බවත්,එලවළු පොළේ පමණක් විකුණන බැවින් ගැටළුවක් මතු වූ බවත නමුත් මේ වන විට සුපිරි වෙළඳසැල් වල සහ එලවළු කඩ වලද විකුණන බවත් ප්‍රකාශ කරන ලදී. මාර්ගයේ අනතුරුදායක තත්ත්වය සහ බදු මුදල් ගෙවන වෙළඳුන්ට සිදු වන අසාධාරණය හේතුවෙන් මාර්ගයේ වෙළඳාම් කරන පුද්ගලයින්ව නියාමනය කිරීමට සභාවේ යෝජනා කල බවත් ප්‍රකාශ කරන ලදී. බදු මුදලකට කඩයක් ගෙන අලුතින් සිල්ලර වෙළඳාම් ආරම්භ කරන පුද්ගලයෙකුට එය සිදු නොකරන ලෙසට තහනම් කර ඇති බවත්,එය ගරු සභාපතිතුමාගේ කොට්ඨාසයේ තිබෙන බවත් එහි වෙළඳාම් කරනුයේ සිල්ලර අල ලූණු වැනි ද්‍රව්‍යය බවත් එය වසා දමන ලෙසට ආදායම් පරිපාලක ගොස් පවසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. අද දින කොළින්ජාඩියේ සිට වෙන්නප්පුව වන තෙක් එලවළු කඩ, සිල්ලර කඩ තිබෙන බවත් පොළේ විකුණන ද්‍රව්‍යයම පාරේද විකුණන බවත් මේ මොහොතේ ජනතාව මොනවා හෝ විකුණා කීයක් හරි සොයා ගැනීමට උත්සාහ කරන බවත් එහිදී මෙම ගැසට් නිවේදනය පෙන්වමින් ජනතාව අපහසුතාවයට පත් නොකර සිටුමුයැයිද ප්‍රකාශ කරන ලදී. එම කඩය පාරේ දමා හෝ අනවසරයෙන් ඉදි කර නොමැති බවත් එහිදී වරිපනම් ගෙවන බවත්, වෙලඳ බලපත්‍රයක්ද ලබා දිය හැකි බවත් එයට බදු මුදලක් අය කරන බවත් පොළ පැවැත්වෙන දිනයට වැසීමටද ඔවුන් එකඟ බවත් ප්‍රකාශ කරන ලදී. සොරු මකොල්ලකරුවන් බෝ කිරීමට වඩා කවුරුන් හෝ තම ස්ව උත්සාහයෙන් යමක් කරන්නේ නම් එම ව්‍යාපාරයෙන් අනෙක් ජනතාවටද සහනයක් ලැබෙන්නේ නම් එය යෝග්‍ය බවත්, එලවළු ලාභ කාලයේදී රැල්ලට පැමිණ සෑම තැනම එලවළු විකිනීම නියාමනය කල යුතු බවත් නමුත් මෙවැනි මිනිසුන්ගේ ව්‍යාපාරය එදා සිටම මෙම ව්‍යාපාරය බවත් ප්‍රකාශ කරන ලදී.කොලින්ජාඩියේ සිට වෙන්නප්පුව වන තෙක් විශාල ලෙස සිල්ලර වෙළඳසැල් තිබෙන බවත් ඒවා පොළ දිනයේ නොවසනා බවත් නමුත් මොවුන් එදින වැසීමටද එකඟවී සිටින බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.එවැනි ස්ථාන වලින් අඩුවට ජනතාවට බඩු මිලදී ගැනීමටද හැකි බවත් ප්‍රකාශ කරන ලදී. එබැවින් ඔවුන්ට බල පත්‍රයක් නිකුත් කර සාධාරණ ලෙස සිතා පොදුවේ සියළුම දෙනාට මෙම ව්‍යාපාර කරගෙන යාමට අවස්ථාව ලබාදෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

දංකොටුවේ නිර්මාණය වූ ගැටළුවක් සමඟ නැවත නගර සීමා ගැසට් කල බවත්, දංකොටුවේ දෛනික වෙළඳපොලක් තිබෙන බවත් ඔවුන් දිනපතා බදු මුදලක් ගෙවන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.නගර සීමාව තුළ පළමුව මිල්රෝයි ඇමතිතුමාගේ ඉඩමේ මීට වසර ගණනාවකට පෙර එලවළු කඩයක් ස්ථාපිත වූබවත්, ඉන්පසුව දෙමටපිටිය හංදියේ කඩයක් ඉදි කල බවත්, ඉන්පසුව පන්නල පොළවල් වලට විශාල අර්බුදයක් ඇති කල ව්‍යාපාරිකයෙකු විසින් වයික්කාලේ විශාල කඩයක් ඉදි

කල බවත් ඔවුන් වෙන්නප්පුව නගරයට පැමිණි විට ඒ සඳහා ඉඩ ලබා නොදුන් බවත් ප්‍රකාශ කරන ලදී.දංකොටුව සරෝජා මුදලාලිගේ කඩයක් මෙම නගර සීමා ගැසට් කිරීමට හේතු වූ බවත් තමන් අවසර ලබානොදුන් විට තමන්ව ගනන් නොගෙන කඩය ස්ථාපිත කල බවත්, දුම්මලදෙණියේද එලෙස විශාල කඩයක් දැමූ බවත් මේවා සමඟ කොවිඩ් -19 සමයේ තේ කඩයක් සම්පූර්ණයෙන්ම එලවළු කඩයක් බවට පරිවර්ථනය කල බවත් ප්‍රකාශ කරන ලදී.අද වන විට වෙන්නප්පුව පොලේ එලවළු නොමැති බවත්, කිරිමැටියාන පොල ලක්ෂ තුන හතරකට ගිය බවත් නමුත් අද වන විට යම් මුදලක් ඒ තුළින් සොයා ගැනීමට නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී. ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා පවසන දෙයට තමන් එකඟ බවත් නමුත් නීතියද තිබිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.මෙම පුද්ගලයාට අවසරය ලබා දුනහොත් මස් කඩය අසල නතර කරන තබාගෙන සිටින පුද්ගලයාටද අවසරය ලබා දිය යුතු බවත්, එවිට පොල වැසී යන බවත් ප්‍රකාශ කරන ලදී. වෙන්නප්පුව පොල රැකී පවතිනුයේ රෙදි වෙළඳුන් නිසා බවත් එම බදු මුදලින් සමස්ථ ආසනයම චක්‍රියව ජීවත් කරවන බවත් ප්‍රකාශ කරන ලදී. නඩු දමා ඇති බවත් නීතිය අකුලා ගන්නද නැතිනම් නීතිය සමඟ තමන් ක්‍රියාකරන්නදැයි තීරණය කරන ලෙසටද පවසා සිටින ලදී.

තමන් මෙහිදී එලවළු කඩ පිළිබඳව කතා නොකරන බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

ගැසට් එක අනුව කතා කරමුයැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරමින් වෙන්නප්පුව හා දංකොටුව දියුණු කල ගම් ප්‍රදේශ හෙවත් වරිපනම් බල ප්‍රදේශ,පොදු වෙළඳපල ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව ඉදිරිපත් කරන ලදී.එහිදී “ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව හා එකී අංක 120 හා 121 ඡේදවලින් පැවරී ඇති බලතල ප්‍රකාර ඊට අදාළ 1987.08.23 වැනි දින අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස ඉදිකිරීම් ගරු අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 33 වැනි කොටසේ පොදු වෙළඳ පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව,2021 ජනවාරි 01 දින සිට බලාත්මකවන පරිදි,වෙන්නප්පුව නගරයේ දියුණු කළ ගම් ප්‍රදේශය ලෙස නම් කර ඇති(වරිපනම්) ප්‍රදේශය වෙන්නප්පුව පොදු වෙළඳපල ප්‍රදේශය ලෙසත්, දංකොටුව නගරයේ දියුණු කළ ගම් ප්‍රදේශය ලෙස නම් කර ඇති (වරිපනම්) ප්‍රදේශය දංකොටුව පොදු වෙළඳපල ප්‍රදේශය ලෙසත්,වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2020.12.10 වැනි දින පැවති 15 වන මහා සභාවේ දී ගනු ලැබූ අංක 15 දරන තීරණය ප්‍රකාරව,ප්‍රකාශයට පත් කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.” ලෙස සඳහන් වන බවත් ප්‍රකාශ කරන ලදී. මේ ආකාරව කටයුතු කිරීමට බලය තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

වෙන්නප්පුව සතිපොලට පැමිණෙනුයේ වෙන්නප්පුව ජනතාව නොව අවට ජනතාව බවත්, අඟහරුවාදාට පොල පැවැත්වුවද කඩ සඳුදා දින වසා දමන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

තමන්ට කඩ වැසීමට පැවසීමට බලයක් නොමැති බවත්, මේ සියල්ල ජනතාවගේ යහපත දරුවන්ගේ යහපත උදෙසා තම අණ පණත් ලෙස ක්‍රියාත්මක වන දේවල් බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම ව්‍යාපාරිකයින් බදු මුදල් ගෙවන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී. එසේ නම් සිල්ලර වෙළඳසැල් වල තිබෙන අල ලූණුද නැවතීමට සිදු වන බවත් මෙයද ස්ථිර ගොඩනැගිල්ලක් තුළ පවත්වන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී. එම පුද්ගලයා වසර ගණනාවක සිට පොළේ වෙළාම කරන පුද්ගලයෙකු බවත් ප්‍රකාශ කරන ලදී.

කඩ දැමූ කිසිවෙකු නැවන වෙළඳාම් කිරීමට පොළට නොපැමිණෙන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මෙම පුද්ගලයා පැමිණෙන බවත් එසේත් නොමැති නම් තමන් කතානොකරන බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.කොලින්ජාඩියේ තිබෙන පළතුරු කඩය දින 07ම විවෘත කර ඇති බවත් පොලේද පළතුරු තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී.

මෙය මහා සභාවේ ගත් තීරණයක් අනුව කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

මහා සභාවේ කතා වූයේ එලවළු පිළිබඳව බවත් ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

(iv) ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 2018දී ප්‍රාදේශීය සභාවට පත් වී පොදු ජන පෙරමුණ ලෙස අති විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා බහුතර මන්ත්‍රී මණ්ඩයක් සමඟ පැමිණ කටයුතු සිදු කරගෙන යන බව ප්‍රකාශ කරන ලදී. එහිදී විපක්ෂය ලෙස යම් යම් චෝදනා යම් යම් කාරණා ඉදිරිපත් කල බවත්, මත ගැටුම් ඇති වූ බවත් නමුත් එම කරගෙන ගිය වැඩ පිළිවෙලට විපක්ෂය විරුද්ධ වී ඇත්තේ කීයෙන් කීයකටදැයි වාර්තා ගෙන බලන ලෙසත් ප්‍රකාශ කරන ලදී.ඒකමතිකව සම්මත වූ ලෙස සියළුම කටයුතු සිදු කරගෙන ගිය බවද ප්‍රකාශ කරන ලදී.විපක්ෂය ආණ්ඩුපක්ෂය කරන දේ විවේචනය කරන බවට පැවසූ බවත් ගරු සභාපතිතුමාට මේවා කරගෙන යාමට ඉඩකඩ ලැබුණ බවද ප්‍රකාශ කරන ලදී. වසරක් දීර්ඝ නොවීමට සභාවේ කාලය අවසන් වන බවත් ශේෂ පත්‍රය ගෙන බැලූ විට අද වන විට ගමේ ඉදි ආප්ප විකුණන පුද්ගලයාට අද වන විට සිදු වී ඇති දෙය දෙස බලන ලෙසත්, ඔවුන් ඒවා විකුණා මාළිගා සකස් කිරීමට නොගිය බවත් දරුවන්ට ඉගැන්වීමට හෝ වේලක් ආහාර සපයා ගැනීමට එම කටයුතු සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.එදාවේල සොයාගෙන කන ජනතාව සිටින බවත්, ඔවුන් වෙනුවෙන් සියළුම දෙනාම සභාවේ හඬ නැඟූ බවත් අවසානයේ රටේ දැවැන්ත අර්බුදයක් සමඟ සිටින බවත් ප්‍රකාශ කරන ලදී. ගරු සභාපතිතුමාලාට අධික බලයක් සහිත ආණ්ඩුවක් තිබෙන බවත්, ජනාධිපතිවරයෙකු සිටින බවත්,තුනෙන් දෙක තිබෙන බවත්,විධායක බලතල තිබෙන බවත් විසිවෙනි සංශෝධනය අනුව 69 ලක්ෂයක බලයක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ජනතා විමුක්ති පෙරමුණ ලෙස තම පක්ෂයද බලාපොරොත්තු වූ ස්ථානයට යාමට නොහැකිව ඉතාමත් පහළට ගිය බවත්,3% ලෙස විහිලු කල බවත් නමුත් ඒ පැවසූ සියළු දේම අද වන විට 69 ලක්ෂය ජනවරමක් ලබාදීද සිදු කර ගැනීමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එය පෙනී යන බවත්, මහා සභාවේ වාර්තාවේ කොලය බාල කර එවීමට තරම් අද වන විට රටේ තත්ත්වය වැටී ඇති බවත් අද වන විට දැවැන්ත උද්ඝෝෂණ රැල්ලක් රටේ තිබෙන බවත්, ආණ්ඩු පක්ෂයෙන් සහ ගමේ සිටින මන්ත්‍රීවරුන් පවා එය දේශපාලන රැල්ලක් ලෙස මතු කර ගැනීමට උත්සාහ කරන බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් ජනතාව වෙනුවෙන් අනිවාර්යෙන්ම අරගලකරන බවත් වසර 74ක ප්‍රධාන පාලකයින් සිදු කල දේට වසර 74ක සාපය නිමා කරමුයැයි නුගේගොඩ රැලිය සිදු කල බවත් ප්‍රකාශ කරන ලදී.

යහපාලනයට උදව් කල බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

දේශපාලන ව්‍යාපාරයක් ලෙස ප්‍රධාන පක්ෂයක් සමඟ යම් මොහොතක හිට ගත්තේ නම් එය සිදු කලේ පක්ෂය ගැන සිතා නොව රට ගැන සිතා බවත් ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ප්‍රකාශ කරන ලදී.සුනාමි සහන මණ්ඩලය ගෙනා විට රට ගැන සිතා ඉවත් වූ බවත් ප්‍රකාශ කරන ලදී. අදට ඒවා වලංගු නොවුනද එම නිශ්චිත මොහොතේ ඒවා ගත් තීරණ නිවැරදි බවත් ප්‍රකාශ කරන ලදී. අවස්ථානුකූලව ගත් තිරණ නිවැරදි බවත්,මේ වන විට පවතින නිශ්චිත ප්‍රශ්නය නම් ආණ්ඩුව ජනතාවගේ එදිනෙදා ගැටළු සඳහා පිළියම් යෙදීමට අසමත් වී ඇති බවත් එය පිළිගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී.අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති වූ අවස්ථාවේ සභාවේ සුභාශිංසනය පවසා ලිපියක් යැවූ බවත් එය ජනතාව වෙනුවෙන් සිදු කල බවත් එසේ නම් මේ මොහෝතේ ජනතාවගේ වත්මන් තත්වය පවසා මාසෙකින්වත් මෙම ගැටළු විසඳන ලෙසට ලිපියක් මඟින් පවසන ලෙසටද ඉල්ලා සිටින ලදී.ජනතාවට අවම පහසුකම් යටතේ ජීවත් වීමටවත් අවශ්‍ය ඉඩ ප්‍රස්ථාව ලබාදෙන ලෙසටද පවසන ලෙස තවදුරටත් ප්‍රකාශ කරන ලදී.තමන්ටද මාසිකව මේ වන විට බෙහෙත් ගැනීමට පෙරට වඩා වැඩි මුදලක් වැය වන බවත් තමන්ගේ ආදායම හා බැලීමේදී එය ප්‍රමාණවත් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. තමාගේ යටතේද සේවකයින් සිටින බවත් ඔවුන්ගේ

පඩිය වැඩි කිරීමට නොහැකි වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.ප්‍රායෝගික ගැටළු තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තව මාසෙකින් හෝ විසඳුම් ලබා දෙන්නේ නම් ජනතාව නිහඬ වන බවත් එවිට උද්ඝෝෂණ වලට මැරයන් යෙදවීමට අවශ්‍ය නොවන බවත් ප්‍රකාශ කරන ලදී.ගරු සනත් නිශාන්ත ඇමතිතුමාගේ සහෝදරයාව අදටත් අත්අඩංගුවට ගෙන නොමැති බවත් එක රටක් එක නීතියක් නම් එයද ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මේ වන තෙක් ජනාතව ගල් කැටයක් වත් අතට ගෙන නොමැති බවත් සියළුම බලය ලබා දී සියල්ල දුන් පසුව කිසිවක් කර ගැනීමට නොහැකි නම් රජය අසමත් බව පවසමින් තම කතාව අවසන් කරන ලදී.

මේවා තේරුමක් ඇතිව කතා කරමුයැයිද, මේ සියල්ලම සැම දෙනාම දන්නා බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.පාර්ලිමේන්තුවට වත් මෙය එකඟතාවයකට පැමිණ විසඳා ගැනීමට නොහැකි වී ඇති බවත් එබැවින් අප කතා කර තේරුමක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී.තමන් කතා කර මෙලෙස හෝ තෙල් ගෙනැවිත් ලබාදෙන බවත් ඒවාද වැරදි ලෙස භාවිතා කරන බවත් ප්‍රකාශ කරන ලදී.මංකොල්ල කන බවත් තමන් පොලීසිය දැනුවත් කල බවත් ප්‍රකාශ කරන ලදී. තමන්ට බලයක් තිබේ නම් තමන් ජනතාව වෙනුවෙන් කටයුතු කරන බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා පැවසූ දෙය සත්‍ය බව ගරු මන්ත්‍රී එම්.එම්.ජිනේන්ද්‍ර විශ්වනාත් මංචනායක මහතා ප්‍රකාශ කරන ලදී.

එය තම සිතේ ද තිබෙන බවත්, මෙම රට බේරා ගත යුතු බවත් ,නායකයින් දුරවල වීමේදී වෙනත් පිරිසක් රට ඩැහැ ගැනීමට බලා සිටින බවත්, කුමන්ත්‍රණ කර විනාශ කිරීමට පිරිසක් බලා සිටින බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. ජනාධිපතිතුමා රට භාර ගැනීමට විවෘත ආරාධනාවක් සිදු කල බවත් නමුත් කිසිවෙකු බාර නොගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිශ්නාත් සරත්චන්ද්‍ර මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව මැරයන් විසින් පැමිණ අහිංසක ජනතාවට තෙල් ගැනීමට ඉඩ ලබා නොදෙන බවත් හැකි නම් එයට ක්‍රමවේදයක් සකස් කර දෙන ලෙසද ඉල්ලා සිටින ලදී.

තමන්ව දැනුවත් කරන ලෙසත් තමන් සොයා බලා කටයුතු කරන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

කැන් වලට තෙල් දීම හැකි නම් නතර කර දෙන ලෙස ගරු මන්ත්‍රී ඩී.එල්.අමල් සුරංග මහතා ප්‍රකාශ කරන ලදී.

එය අපට සිදු කල නොහැකි බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

තෙල් ගැනීමට එන විට ග්‍රාම නිලධාරී නිර්දේශය රැගෙන එන ලෙසට පවසන ලෙස ගරු මන්ත්‍රී ඩබ්.ඒ.ගෝඨාභය වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කරන ලදී.

යෝගියාන ජයසුමානාරාම විහාරස්ථානයට පසුගිය දින බුද්ධ ප්‍රතිමාවක් පරිත්‍යාග කල බවත් එම ප්‍රතිමාව අසලට විදුලි බල්බයක් ලබාදෙන ලෙසට ස්වාමින් වහන්සේ ඉල්ලීමක් කල බවත් ගරු මන්ත්‍රී අයි.බී.සැම් හරිශ්නාත් සරත්චන්ද්‍ර මහතා ප්‍රකාශ කරන ලදී.

නායක ස්වාමින් වහන්සේ කතා කල බවත් එය අනිවාර්යෙන්ම ලබාදෙන බවත් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

න්‍යාය පත්‍රය අනුව සියළු වැඩ කටයුතු අවසන් වූ හෙයින් සියලු දෙනාටම ස්තුතිය පළ කරමින් ගරු සභාපතිතුමා විසින් ප.ව 2.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදි.

<u>සංශෝධන</u>

ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතා ගරු සභාපතිතුමාගෙන් අවසර ගැනීමෙන් පසුව 22 වන පිටුවේ තම කතාවේදී “ විසි වන සංශෝධනය අනුව 69 ලක්ෂයක බලයක්” ලෙස සඳහන් වී ඇති බවත්, එය “ජනාධිපතිවරණයේදී 69 ලක්ෂයක බලයක්” ලෙස සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම 23 වන පිටුවේ තමන් කතාවේදී ගරු සනත් නිශාන්ත ඇමතිතුමාගේ සහෝදරයාව අත්අඩංගුවට ගෙන නොමැති බවත්, එයට හේතුව සඳහන් කල බවත්,නමුත් එම කොටස වාර්තාවේ සඳහන් වී නොමැති බවත්, එය වාර්තාවට ඇතුළත් විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

හඬ පටිය පරීක්ෂා කර බලා අවශ්‍ය සංශෝධනයන් සිදු කරන බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතාගේ කතාවේ පලමු ඡේදයේ එම කොටස පහත පරිදි සංශෝධනය විය.

"ගරු සභාපතිතුමාලාට අධික බලයක් සහිත ආණ්ඩුවක් තිබෙන බවත්, ජනාධිපතිවරයෙකු සිටින බවත්,තුනෙන් දෙක තිබෙන බවත්,විධායක බලතල තිබෙන බවත්,අධික බලයක් ජනතාව ලබා දී තිබෙන බවත්,ජනතාව පොඩි ප්‍රමාණයක් නොව 69 ලක්ෂයක බලයක් ලබා දී ඇති බවත් ප්‍රකාශ කරන ලදී."

ඒ අනුව ගරු මන්ත්‍රී ටී.බී.ඩී.ඇන්ටනී කුමාර් මහතාගේ කතාවේ දෙවන ඡේදයේ එම කොටස පහත පරිදි සංශෝධනය විය.

" ගරු සනත් නිශාන්ත ඇමතිතුමාගේ සහෝදරයා වන ජගත් සමන්ත නම් පුද්ගලයා තම පක්ෂයේ කෙනෙකුට පහර දුන් බවත් අදටත් අත්අඩංගුවට ගෙන නොමැති බවත් එක රටක් එක නීතියක් නම් එයද ක්‍රියාත්මක විය යුතු බවත් ප්‍රකාශ කරන ලදී."

තීරණ අංක 01

2022-04-08 වන දින පැවති මහා සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.කිත්සිරි අභයවික්‍රම මහතාගේ හා ගරු මන්ත්‍රී යූ.ජුඩ් එම්මානුවෙල් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**කේ.වී.සුසන්ත පෙරේරා,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව වෙන්නප්පුව.**